# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග

# ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග[1]

## මුදල් ප්‍රතිපත්තිය

| | | |
|---|---|---|
| 2021 අගෝස්තු 19 | - | නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පිළිවෙළින්, 5.00% සහ 6.00% දක්වා පදනම් අංක 50කින් ඉහළ නංවන ලදී. බැංකු අනුපාතිකය 8.50% සිට 9.00% දක්වා ස්වංයක්‍රීයව වැඩි විය. |
| | - | බලපත්‍රලාභී වාණිජ බැංකුවල සියලු රුපියල් තැන්පතු වගකීම් සඳහා අදාළ වන ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය, 2021 සැප්තැම්බර් 01 දිනෙන් ආරම්භ වන සංචිත පවත්වාගෙන යෑමේ කාලපරිච්ඡේදයේ සිට ක්‍රියාත්මක වන පරිදි 2.00% සිට 4.00% දක්වා ප්‍රතිශතාංක 2කින් ඉහළ නංවන ලදී. |

## විශේෂ ණය යෝජනා ක්‍රම

| | | |
|---|---|---|
| 2021 මාර්තු 04 | - | "උසස් ජීවන තත්ත්වයක් උදෙසා ගුණාත්මක අන්තර්ගතභාවයක්" යන දැක්මෙන් යුතුව ශ්‍රී ලංකාව සඳහා වන මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපායමාර්ගය එළිදක්වන ලදී. |
| 2021 මාර්තු 24 | - | සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ, සංචාරක ක්ෂේත්‍රයට අදාළව ලබා ගෙන ඇති ණය සඳහා අදාළ ණය සහන කාලය, 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමටත්, ණය ආපසු ගෙවීමේ කාලය මාස 36ක් දක්වා දීර්ඝ කිරීමටත් හැකි වන පරිදි අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2021 මැයි 04 | - | සහභාගීත්ව මූල්‍ය ආයතනවලට තෝරා ගත් කෘෂිකාර්මික අගය දාමයන් කිහිපයක නිරත පුද්ගලයින්ගේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසිය හැකි වන පරිදි, දේශීය කෘෂිකාර්මික සංවර්ධන නියමු ව්‍යාපෘතිය නමින්, නව ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට අදාළ මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2021 ජූනි 09 | - | සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම යටතේ සෑම ක්ෂේත්‍රයකටම ලබා දුන් කාරක ප්‍රාග්ධන ණය සඳහා අදාළ ණය සහන කාලය 2021 සැප්තැම්බර් මස 30 දක්වා දීර්ඝ කිරීමටත්, ණය ආපසු ගෙවීමේ කාල සීමාව මාස 36ක් දක්වා දීර්ඝ කිරීමටත් හැකි වන පරිදි අදාළ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. |
| 2021 ජූනි 16 | - | පහත සඳහන් ක්‍රියාමාර්ග සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී:<br>• ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම සඳහා ණය ඇපකර සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.<br>• ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ කිරි නිෂ්පාදන ව්‍යවසාය අංශය සංවර්ධනය කිරීම සඳහා ණය ඇපකර සහ පොලී සහනාධාර යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම.<br>• වයඹ පළාතේ කුරුණෑගල සහ පුත්තලම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි කුරුණෑගල ප්‍රදේශයේ නව ප්‍රාදේශීය කාර්යාලයක් පිහිටුවීම. |
| 2021 සැප්තැම්බර් 01 | - | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා ලබා දෙන ණය සඳහා ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 30 | - | රජය සතු ව්‍යවසායයන්හි ව්‍යවස්ථාපිත බැඳීම් පියවමින් සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලමින්, එම රජය සතු ව්‍යවසායයන් නැවත බල ගැන්වීම සඳහා වූ ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස "සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම - අදියර IV" හඳුන්වා දීම සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී. |

1 2021 ඔක්තෝබර් 21 දක්වා වන කාලය තුළ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඇතුළත් වේ.

## මූල්‍ය අංශය

### බලපත්‍රලාභී බැංකු

2021 ජනවාරි 13 - වසංගත තත්ත්වය හමුවේ, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට සහන සැලසීම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ගවලට සමගාමීව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව ගනු ලබන ණය අය කර ගැනීමේ ක්‍රියාමාර්ග මාස හයක කාලයකට අත්හිටුවන ලෙස දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 ජනවාරි 19 - බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම්වලට පනවා තිබූ සීමා කිරීම් ලිහිල් කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. ඒ අනුව, 2020 වසර සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල විගණන කටයුතු අවසන් කිරීමෙන් අනතුරුව, මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැර කිරීම සඳහා අවසර ලබා දෙන ලදී. තව ද, 2021 වසරේ ජූනි 30 දක්වා සිය කොටස් ආපසු මිලට ගැනීමෙන් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ දැමීමෙන් වැළකී සිටින ලෙසත්, ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසට බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී.

2021 ජනවාරි 25 - 2021 වසර සඳහා අපේක්ෂිත අලාභ ගණනය කිරීමේ දී, රජය විසින් නිකුත් කළ, විදේශ මුදලින් නාමනය කරන ලද, මූල්‍ය උපකරණ සඳහා ඇති නිරාවරණයන්ගේ ණය පැහැර හැරීමක දී විය හැකි යැයි සැලකිය හැකි අවම අලාභ ප්‍රතිශතය 10%ක් දක්වා පහත දමමින්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9: මූල්‍ය උපකරණ ප්‍රමිතයට අදාළව නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංශෝධනය කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

- 2021 වසර සඳහා රජය වෙතින් අය වීමට ඇති, විදේශීය මුදලින් ගෙවීම් සඳහා වන අවධානම මත බර තැබීම් 20% සිට 10% දක්වා සහ උකස්කර මත ලබා දී ඇති නිවාස ණය සඳහා අදාළ බර තැබීම 50% සිට 35% දක්වා අඩු කරමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

- විදේශ විනිමය වෙළෙඳපොළ තුළ පවතින අධි විචලතාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින්, වහාම ක්‍රියාත්මක වන පරිදි මාස තුනක කාලයක් සඳහා විදේශ මුදල් ඉදිරි ගිවිසුම් සඳහා එළඹීමෙන් වළකින ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 මාර්තු 10 - කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ, මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු (ලීසිං) පහසුකම් සඳහා 2021 වසරේ අප්‍රේල් 01 දින සිට මාස හයක ණය සහන කාලයක් ලබා දෙන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 මාර්තු 18 - බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය විශාල වශයෙන් පිටතට ගලා යාමට ඇති හැකියාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය සහ විනිමය අනුපාත මත ඇති විය හැකි පීඩනය සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2021 වසරේ මාර්තු 23 දින සිට 2021 වසරේ අප්‍රේල් 09 දක්වා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 මාර්තු 19 - කොවිඩ්-19 නිසා බලපෑමට පත් සංචාරක ක්ෂේත්‍රයේ නියුතු ව්‍යාපාර හා පුද්ගලයන් වෙත පිරිනමන ලද ණය සහන කාල සීමාව, 2021 වසරේ අප්‍රේල් 01 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ගනුදෙනුකරුවන් විසින්, මෙම දීර්ඝ කරන ලද ණය සහන කාලය අවසන් වීමට පෙර, සිය ණය පහසුකම් දිගු කාලීනව ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් සැපයීම මෙමගින් අපේක්ෂා කෙරේ.

2021 අප්‍රේල් 09 - බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය ප්‍රවාහ පිටතට ගලා යාමට ඇති හැකියාව, එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමණාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාතික මත ඇති විය හැකි පීඩනය සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම 2021 වසරේ අප්‍රේල් 23 දින දක්වා අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 21 - ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ප්‍රමුඛතා ක්ෂේත්‍රයන් ලෙස සලකමින්, එම ක්ෂේත්‍රයන්හි නියුතු පුද්ගලයන් හා ව්‍යාපාර වෙත බලපත්‍රලාභී බැංකු විසින් ලබා දෙන ණය සහ අත්තිකාරම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමේ ඉලක්ක හඳුන්වා දෙමින් මූල්‍ය නීති පනත් නියෝග නිකුත් කරන ලදී. මේ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් ඔවුන්ගේ පසුගිය වසර අවසානය වන විට පැවති ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ලබා දී තිබූ මුළු ණය ප්‍රමාණයට සාපේක්ෂව වාර්ෂිකව 20%ක ප්‍රතිශතයකට නොඅඩු ප්‍රමාණයකින් ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට ලබා දෙන ණය පහසුකම් ඉහළ දැමීමට කටයුතු කළ යුතුය.

2021 අප්‍රේල් 23 - බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය පිටතට ගලා යාමට ඇති හැකියාව, එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමණාකරණය මත ඇති විය හැකි බලපෑම සහ විනිමය අනුපාතික මත ඇති විය හැකි පීඩනය සැලකිල්ලට ගෙන, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලට ගැනීම නැවත දැනුම් දෙන තුරු අත්හිටුවමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 25 - විදේශ විනිමය වෙළඳපොළ තුළ පවතින අධි විචලතාව සහ එමගින් බලපත්‍රලාභී බැංකුවල අවදානම් කළමනාකරණය මත ඇති විය හැකි බලපෑම සැලකිල්ලට ගනිමින්, කොන්දේසිවලට යටත්ව, නැවත දැනුම් දෙන තුරු ස්ථානීය දිනයෙන් ඔබ්බට වලංගු දින සහිත විදේශ මුදල් ඉදිරි ගිවිසුම් සඳහා එළඹීමෙන් වළකින ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී.

2021 මැයි 25 - මූර්ත ආර්ථිකය තුළ ප්‍රාග්ධන ගොඩනැගීම සහ රටේ විදේශ මුදල් අවශ්‍යතා සපුරාලීම උත්තේජනය කිරීම සඳහා, මුළු විදේශ මුදල් ණය සීමාව 10% දක්වා පවත්වා ගෙන යාමේ කොන්දේසියට යටත්ව, බලපත්‍රලාභී බැංකුවල කෙටි කාලීන ණය සීමාවන් වසරක කාලයක් සඳහා අහෝසි කරමින් බලපත්‍රලාභී බැංකුවල විදේශ මුදල් ණය සීමාවන් පිළිබඳ බැංකු පනත් විධාන සංශෝධනය කරන ලදී.

- කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ලබා දිය යුතු ණය සහන හා පවත්නා සහන දීර්ඝ කිරීම් දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. කොවිඩ්-19 ව්‍යසනය නිසා බලපෑමට පත් ණය ගනුදෙනුකරුවන් මත ඇති පීඩනය අවම කරමින් මෙම යෝජනා ක්‍රමය සියලු බලපත්‍රලාභී බැංකු ඔස්සේ ඒකාකාරීව ක්‍රියාත්මක කරවීම මෙම චක්‍රලේඛයේ අරමුණයි.

2021 ජූනි 07 - කොවිඩ්-19 ව්‍යාප්තිය පාලනය කිරීම සඳහා පනවා ඇති සංචරණ සීමා මධ්‍යයේ අත්‍යවශ්‍ය බැංකු සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමේ දී, අදාළ සෞඛ්‍යාරක්ෂක ක්‍රියාමාර්ග සහ මාර්ගෝපදේශ දැඩි ලෙස අනුගමනය කරමින් බැංකු සේවා පවත්වාගෙන යන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් චක්‍රලේඛයක් නිකුත් කෙරිණ.

2021 ජූනි 16 - ආයතනික විශේෂිත ආතතීන්, වෙළඳපොළ පදනම් ආතතීන් හෝ ඒ දෙකේම සංකලනයක් හේතුවෙන් බැංකුවල ප්‍රාග්ධනයට, ද්‍රවශීලතාවයට සහ අනෙකුත් සියලුම අංශ මත ඇති විය හැකි කම්පනවලට සාර්ථකව මුහුණ දීම සඳහා ප්‍රතිසාධන සැලැසුම් (Recovery Plans) සකස් කර පවත්වා ගෙන යන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙමින් බැංකු පනත් විධානයක් නිකුත් කෙරිණි.

- විදේශයන්ගෙන් ලබා ගත් නව විදේශ විනිමය ණය ගැනීම් භාවිත කරමින්, ශ්‍රී ලංකා ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සහ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවලින්, එක් වර්ගය සඳහා 50% බැගින් වූ සමාන අනුපාතයන්ගෙන් ආයෝජනය කිරීමේ කොන්දේසියට යටත්ව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ද්විතීයික වෙළෙඳපොළ තුළ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර මිලදී ගැනීමට අවසර ලබා දෙමින් බැංකු පනත් විධාන නිකුත් කරන ලදී.

2021 ජූනි 18 - බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝග යටතේ නම් කරන ලද විදේශ මුදල් විශේෂයන් අතරට තායි බාත් මුදල් වර්ගය ඇතුළත් කිරීම දැනුම් දෙමින් බැංකු පනත් නියෝගයක් නිකුත් කරන ලදී. මෙමගින් 2011 අංක 01 දරන බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගයේ උපලේඛනය යාවත්කාලීන විය.

2021 ජූලි 13 - බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම සීමා කරමින් බැංකු පනත් නියෝග නිකුත් කෙරිණි. ඒ අනුව, 2021 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන/අතුරු මූල්‍ය ප්‍රකාශන විගණනය කර අවසන් වන තුරු මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ මෙරටින් බැහැරට යැවීමෙන් වැළකී සිටින ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. තවද, 2021 දෙසැම්බර් 31 දක්වා තම කොටස් ආපසු මිලට ගැනීමෙන් සහ අත්‍යවශ්‍ය නොවන වියදම් ඉහළ දැමීමෙන් වැළකී සිටින ලෙස සහ ප්‍රාග්ධන වියදම් සිදු කිරීමේ දී ඉතා විචක්ෂණශීලීව සහ නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරන ලෙසට බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී.

2021 අගෝස්තු 21 - නිරෝධායන ඇඳිරි නීතිය යටතේ 2021 වසරේ අගෝස්තු 20 සිට 2021 වසරේ අගෝස්තු 30 දක්වා බලපැවැත්වෙන පරිදි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද නිවේදනය අනුව නිකුත් කර ඇති සියලුම ආරක්ෂක පියවර හා මාර්ගෝපදේශ දැඩි ලෙස පිළිපදිමින් අත්‍යවශ්‍ය බැංකු සේවා අඛණ්ඩව සිදු කරන ලෙස දැනුම් දෙමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 අගෝස්තු 24 - බලපත්‍රලාභී බැංකු විසින් රුපියල් සහ විදේශ මුදල් තැන්පතු සඳහා පිරිනැමෙන සහ ගෙවන පොලී අනුපාතවල ඇති විෂමතා සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් සියලුම විදේශ මුදල් තැන්පතු සඳහා ගෙවනු ලබන උපරිම වාර්ෂික සඵල පොලී අනුපාතය 5.00%ට සීමා කරමින් මුදල් නීති පනත් නියෝගයක් නිකුත් කරන ලදී. විදේශ මුදල් විශේෂ තැන්පතු ගිණුම් සඳහා පිරිනැමිය හැකි හෝ ගෙවිය හැකි අතිරේක පොලී අනුපාතය, ඉහත දක්වා ඇති පොලී අනුපාතයට වඩා ඉහළ පොලී අනුපාතයක් විය යුතුය.

2021 සැප්තැම්බර් 01 - කොවිඩ්-19 වසංගත තත්ත්වය යළි ඉහළ යාම සහ එමගින් ව්‍යාපාර හා පුද්ගලයින්ට ඇති වන දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, පීඩාවට පත් ණය ගනුදෙනුකරුවන් සඳහා මීට පෙර (2021 වසරේ අගෝස්තු 31 දක්වා) දී තිබූ සහන 2021 වසරේ දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. මෙමගින් සක්‍රීය සහ අක්‍රීය යන කාණ්ඩ දෙකෙහිම සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ඒ ඒ අවස්ථානුකූලව ණය සහන ලබා ගත හැකිය.

2021 සැප්තැම්බර් 08 - විනිමය අනුපාතිකයේ ස්ථායීතාව සහ දේශීය විදේශ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය පවත්වා ගැනීම සඳහා දැනට පනවා ඇති ක්‍රියාමාර්ගවලට සහය දැක්වීමක් ලෙස, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව හරහා ණයවර ලිපි යටතේ සහ ප්‍රතිග්‍රහණය මත ලියවිලි ලබා දීමේ කොන්දේසි යටතේ, තෝරාගත් අත්‍යවශ්‍ය නොවන/හදිසි නොවන ස්වභාවයේ භාණ්ඩ ආනයනය කිරීමේ දී, වහාම ක්‍රියාත්මක වන පරිදි 100%ක මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී.

- බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අත්‍යවශ්‍ය නොවන/හදිසි නොවන භාණ්ඩ ආනයනය සඳහා වන ණයවර ලිපි මත 100%ක පොලී හිමිකම රහිත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| | - | බලපත්‍රලාභී බැංකුවල බාසල් III ප්‍රාග්ධන අවශ්‍යතාවන් සඳහා වන 2016 අංක 01 දරන බැංකු පනත් විධානයේ අවශ්‍යතාවයන් සඳහා සහ බලපත්‍රලාභී බැංකු සඳහා වන අනෙකුත් අදාළ නියාමනයන්ගේ අවශ්‍යතා සඳහා පිළිගත හැකි බාහිර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් නම් කරමින් චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 13 | - | කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ සංචාරක ක්ෂේත්‍රයේ පුද්ගලයින් වෙත ලබා දී ඇති ණය සහන කාලය 2021 වසරේ ඔක්තෝබර් 01 දින සිට ඉදිරියට මාස 9ක් දක්වා දීර්ඝ කරමින් බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 14 | - | බැංකු ක්ෂේත්‍රය තුළ ඒකාකාරී හා විචක්ෂණශීලී පරිචයන් ස්ථාපිත කිරීම උදෙසා හා බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ ණය හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම හා මැනීම සඳහා පවත්නා නියාමන ආකෘතිය, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 9 (මූල්‍ය උපකරණ) සමඟ අනුයාත කිරීමේ අරමුණින් බලපත්‍රලාභී බැංකු වෙත බැංකු පනත් විධාන නිකුත් කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 30 | - | කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ, බැංකු ක්ෂේත්‍රය තුළ ඒකාකාරී හා විචක්ෂණශීලී පරිචයන් ස්ථාපිත කිරීම උදෙසා බලපත්‍රලාභී බැංකුවල ණය පහසුකම් සහ ණය පහසුකම් හැර අනෙකුත් මූල්‍ය වත්කම් වර්ගීකරණය, හඳුනා ගැනීම සහ මැනීම පිළිබඳ 2021 අංක 13 සහ 2021 අංක 14 දරන බැංකු පනත් විධානවලට පරිපූරක චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 ඔක්තෝබර් 01 | - | බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් අත්‍යවශ්‍ය නොවන/හදිසි නොවන ස්වභාවයේ භාණ්ඩ ආනයනයේ දී ණයවර ලිපි මත 100%ක පොලී හිමිකම රහිත මුදල් ආන්තික තැන්පතු පවත්වා ගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය අහෝසි කරන ලදී. |
| | - | ආනයන සඳහා ඇති ආන්තික තැන්පතු අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2021 අංක 12 දරන බැංකු පනත් විධාන අවලංගු කරමින් බැංකු පනත් විධානයක් නිකුත් කරන ලදී. |
| 2021 ඔක්තෝබර් 05 | - | සංචාරක ක්ෂේත්‍රය ද ඇතුළත්ව කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ මගී ප්‍රවාහන සේවයේ නියුතු ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු පහසුකම් සඳහා ලබා දී තිබූ ණය සහන දීර්ඝ කරමින්, බලපත්‍රලාභී බැංකු වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව, කොවිඩ්-19 නිසා බලපෑමට ලක්වූ පෞද්ගලික සහ පොදු මගී ප්‍රවාහන සේවා සපයන ව්‍යාපාර හා පුද්ගලයන් විසින් ලබා ගත් කල්බදු (ලීසිං) පහසුකම්වලට අදාළව ලැබෙන ඉල්ලීම් 2021 අංක 08 චක්‍රලේඛය යටතේ හා සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවාහන සේවා සපයන්නන්ගෙන් ලැබෙන ඉල්ලීම් 2021 අංක 10 දරන චක්‍රලේඛය යටතේ සලකා බලන ලෙස බලපත්‍රලාභී බැංකු වෙත දැනුම් දෙන ලදී. |
| අපේක්ෂිත | - | නව බැංකු පනත කෙටුම්පත් කිරීම |
| | - | බලපත්‍රලාභී බැංකුවල තාක්ෂණික අවධානම් කළමනාකරණය හා ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ප්‍රතිපත්ති රාමුවක් ස්ථාපනය කිරීම |
| | - | තිරසාර මූල්‍යකරණය (Sustainable Finance) සඳහා බැංකු අංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ගවලට අදාළ පහසුකම් සැලසීම |
| | - | බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර මෙහෙයුම් බාහිරකරණය පිළිබඳ නියාමන රාමුව සංශෝධනය කිරීම |

## බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකරණ සමාගම්

| | | |
|---|---|---|
| 2021 ජනවාරි 01 | - | තක්සේරුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක සංශෝධනය කරමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිශ්චල දේපළ තක්සේරු කිරීමේ විධානයට සංශෝධනයක් නිකුත් කරන ලදී. |

2021 පෙබරවාරි 17 - පළමු ලියාපදිංචියෙන් පසුව වසරකට වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිත කර ඇති, ලියාපදිංචි මෝටර් රථ සඳහා ණය පහසුකම් ලබා ගැනීමේ දී අදාළ වන වටිනාකම් මත ණය අනුපාතය 80%ක් ලෙස සංශෝධනය කරමින්, වටිනාකම් මත ණය අනුපාත විධානය සඳහා සංශෝධන බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2021 මාර්තු 12 - කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ, මගී ප්‍රවාහන සේවයේ නියුතු පුද්ගලයන් සහ ව්‍යාපාර සඳහා 2021 වසරේ අප්‍රේල් 01 වන දින සිට මාස හයක කාලයක් සඳහා ණය සහන ලබා දෙන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 මාර්තු 19 - 2020 වසරේ සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද 2020 අංක 09 දරන චක්‍රලේඛය යටතේ සංචාරක අංශයට ලබා දී ඇති ණය සහනය 2021 වසරේ අප්‍රේල් 01 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා දීර්ඝ කරන ලෙස දන්වා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.

2021 මාර්තු 31 - 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය හා මිනුම්කරණයට අදාළ විධානය ක්‍රියාත්මක කිරීම මාස තුනකින් කල් දැමීම පිළිබඳව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත දැනුම් දෙන ලදී.

- කොවිඩ්-19 වසංගතයේ දිගුකාලීන බලපෑම හේතුවෙන් නිර්මාණය වූ අභියෝගාත්මක වාතාවරණය තුළ ද්‍රවශීලතා මට්ටම් සඳහා ඇති විය හැකි පීඩනය මඟහරවා ගැනීම සඳහා පහසුකම් සැලසීමට 2020 වසරේ සැප්තැම්බර් 30 දින නිකුත් කරන ලද ද්‍රවශීල වත්කම් පිළිබඳ විධානයේ සංශෝධනය, 2021 වසරේ ජූනි 30 දක්වා මාස තුනක කාලයක් සඳහා දීර්ඝ කරමින් විධානයක් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 01 - ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ ගෙවනු ලබන උපරිම වන්දි මුදල රුපියල් 1,100,000 දක්වා ඉහළ නැංවීම සඳහා 2021 අංක 01 දරන රෙගුලාසිය නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 09 - බලපත්‍රලාභී මුදල් සමාගම් විදේශ අරමුදල් සඳහා නිරාවරණය වීම තුළින් ඇති වන මූල්‍ය විචලනයන් ස්ථාවර කිරීම, විදේශ මුදල් ණයට ගැනීමේ දී ඇති වන අවදානම් කළමනාකරණය කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම් සඳහා නියාමන රාමුවක් ස්ථාපිත කිරීම යනාදිය අරමුණු කර ගනිමින් විදේශ මුදල් ණය ගැනීම්වලට අදාළව නව විධානයක් නිකුත් කරන ලදී.

2021 ජූනි 04 - බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම් පිළිබඳව මෙයට පෙර නිකුත් කරන ලද විධානවලට අමතරව, මූල්‍ය හා මූල්‍ය නොවන ආයතන විසින් සිදු කරන විදේශ මුදල් ණය ගැනීම්වලට වසරක කාලයක් සඳහා පහසුකම් සලසන බව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත දැනුම් දෙන ලදී.

2021 ජූනි 09 - කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා වන සහන පිළිබඳ චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. ඒ අනුව, කොවිඩ්-19 තෙවන ව්‍යාප්තියෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර සහ පුද්ගලයින් සඳහා තවදුරටත් සහන ලබා දෙන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වලින් ඉල්ලීමක් කරන ලදී.

2021 ජූලි 05 - කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ණය පහසුකම් මත ලබා ගෙන ඇති වාහන අත්පත් කර ගැනීම සහ නැවත ලබා ගැනීම අවම වශයෙන් ඉදිරි මාස තුන දක්වා (2021 වසරේ සැප්තැම්බර් 30 දක්වා) අත්හිටුවන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී.

2021 ජූලි 07 - මුදල් ව්‍යාපාර පනතේ 2020 අංක 01 දරන ණය පහසුකම් වර්ගීකරණය සහ මිනුම්කරණ විධානය බලාත්මක වන දිනය කල් දමන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින්

| | | |
|---|---|---|
| | | මාසිකව හෝ ඊට වැඩි පදනමින් වාරික වශයෙන් ආපසු ගෙවිය යුතු ණය පහසුකම් සඳහා "විශේෂයෙන් සඳහන් කරන ලද" කාණ්ඩය සහ අදියර 3 වර්ගීකරණය පිළිවෙළින් 2022 වසරේ අප්‍රේල් 01 දින සිට කල් ඉකුත් වූ දිනය ලෙස දින 120 සහ 2023 වසරේ අප්‍රේල් 01 දින සිට කල් ඉකුත් වූ දිනය ලෙස දින 90 උපයෝගී කර ගත යුතු බව දන්වන ලදී. |
| 2021 ජූලි 09 | - | සෑම ප්‍රාථමික අලෙවිකාර සමාගමක් විසින්ම නියමිත අවම ප්‍රාග්ධන මට්ටම, 2021 වසරේ දෙසැම්බර් 31 දක්වා රුපියල් බිලියන 1.0ට නොඅඩු මට්ටමක පවත්වා ගත යුතු අතර ඉන් පසුව 2022 වසරේ ජනවාරි 01 සහ 2023 වසරේ ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙළින්, රුපියල් බිලියන 2.0 සහ රුපියල් බිලියන 2.5ක් දක්වා ඉහළ නංවා ගත යුතු බව දන්වමින් ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳව විධානයක් නිකුත් කරන ලදී. විශේෂ අවදානම් සංචිතයක් පවත්වා ගැනීම සහ ප්‍රාග්ධන තක්සේරු කිරීමේ හා සැලසුම් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ද මෙම විධානය මගින් විස්තර කරනු ලැබේ. |
| 2021 අගෝස්තු 06 | - | ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය යටතේ නිකුත් කර ඇති 2010 අංක 01 දරන රෙගුලාසිය සංශෝධනය කර 2021 අංක 02 දරන නව රෙගුලාසිය නිකුත් කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 10 | - | 2021 වසරේ ජූනි 09 දින නිකුත් කරන ලද චක්‍රලේඛයට සංශෝධනයක් නිකුත් කරමින්, කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා ලබා දී ඇති ණය සහන තවදුරටත් 2021 වසරේ සැප්තැම්බර් 30 දක්වා දීර්ඝ කරන ලෙස බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙතින් ඉල්ලා සිටින ලදී. |
| 2021 සැප්තැම්බර් 24 | - | නිශ්චිත අරමුණු සඳහා පිළිගත හැකි ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනයක් ලෙස "ලංකා රේටින් ඒජන්සි ලිමිටඩ් ආයතනය" ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පිළිගෙන ඇති බව දන්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| 2021 ඔක්තෝබර් 06 | - | රජයේ ආයතන සහ අදාළ පාර්ශ්වයන් කරන ලද ඉල්ලීම් කිහිපයක් සැලකිල්ලට ගනිමින්, කොවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සහ පුද්ගලයන් සඳහා 2022 වසරේ මාර්තු 31 දක්වා ණය සහන ලබා දෙන ලෙස සහ නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග අත්හිටුවන ලෙස දන්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් වෙත චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | මුදල් ව්‍යාපාර පනත සමාලෝචනය කිරීම |
| | - | බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සඳහා වූ නියාමන රාමුව සමාලෝචනය කිරීම |

## රක්ෂණය

| | | |
|---|---|---|
| 2021 මාර්තු 10 | - | 2021 අංක 01 දරන ලාභාංශ ප්‍රකාශය සහ බෙදා හැරීම පිළිබඳ නියෝගයක් නිකුත් කරන ලද අතර එහි දක්වා ඇති නියමයන් හා කොන්දේසි සලකා බැලූ බවට තහවුරු කිරීමක් ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලෙස රක්ෂණ සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩලවලට උපදෙස් ලබා දෙන ලදී. |
| 2021 මාර්තු 23 | - | රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ අදහස අනුව නිෂ්පාදන, සාධාරණ සහ අපක්ෂපාතී බව කොමිෂන් සභාව විසින් තහවුරු කිරීමෙන් පසුව පමණක්, නිෂ්පාදන/රක්ෂණ ඔප්පු ආකෘති දියත් කළ හැකි බව රක්ෂණ සමාගම් වෙත දැනුම් දෙමින් 2021 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2021 මාර්තු 24 | - | කේත ලබා දීම සඳහා වන සීමාවන් සහ කේත වෙනස් කිරීම සඳහා වන සීමාවන් සම්බන්ධයෙන් රක්ෂණ සමාගම් සහ රක්ෂණ තැරැව්කාර සමාගම් සඳහා 2021 අංක 02 දරන නියෝගය නිකුත් කරන ලදී. |

| | | |
|---|---|---|
| 2021 අප්‍රේල් 08 | - | තෙවන පාර්ශ්වීය මෝටර් රථ රක්ෂණ ප්‍රවර්ධනය/දැන්වීම් තහනම් කිරීම පිළිබඳ 2021 අංක 02 දරන චක්‍රලේඛය සියලුම සාමාන්‍ය රක්ෂණ සමාගම් වෙත නිකුත් කරන ලදී. |
| 2021 ජූලි 29 | - | 2021 අංක 03 දරන නියෝගය මගින් සියලුම රක්ෂණකරුවන්ට, රක්ෂණ තැරැව්කරුවන්ට සහ අලාභ ගැලපුම් සේවා සපයන්නන්ට මූල්‍ය අවභාවිතය හෝ වංචාව යන හේතු මත සේවාවන් අත්හිටුවා ඇති පුද්ගලයන් සේවයට බඳවා නොගන්නා ලෙසට නියෝග කරන ලදී. |
| 2021 අගෝස්තු 30 | - | රක්ෂකයන්හට විලම්භිත වගකීම් සහ ලාභාංශ ප්‍රකාශයේ දී හා බෙදා හැරීමේ දී අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල වීම ආවරණය කිරීම සඳහා 2021 අංක 01 දරන නියෝගය සංශෝධනය කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 06 | - | විදුලි සංදේශ සේවා සැපයුම්කරුවන්ගේ සේවා ජාල (ජංගම රක්ෂණය) භාවිතය අවසන් කිරීම සහ එයට සම්බන්ධ කරුණු පිළිබඳව 2021 අංක 04 දරන නියෝගය නිකුත් කරන ලදී. |
| අපේක්ෂිත | - | ලෝක බැංකුවේ මූල්‍ය අංශය නවීකරණ ව්‍යාපෘතියේ සංරචක 11 පිළිබඳ වාර්තාව අවසන් කිරීම |
| | - | දේශීය රක්ෂණ කර්මාන්තය සඳහා ජාත්‍යන්තර යහ භාවිතයන් අනුගමනය කිරීමේ අදහසින්, රක්ෂණ නියාමන කොමිෂන් සභාව, රක්ෂණ දැන්වීම් පිළිබඳ මාර්ගෝපදේශනයක් සකස් කිරීමේ ක්‍රියාවලියේ අවසන් අදියරට අවතීර්ණ වීම |
| | - | ලෝක බැංකුවේ සහාය ඇතිව දැනට පවතින රක්ෂණ කර්මාන්ත පනතේ නියමයන් සංශෝධනය කිරීම. |

## ප්‍රාග්ධන වෙළඳපොළ

| | | |
|---|---|---|
| 2021 ජනවාරි | - | කොළඹ කොටස් වෙළඳපොළ සමග සාකච්ඡා කර කොටස් තැරැව්කාර සමාගම් සඳහා පුළුල් මාර්ගෝපදේශ මාලාවක් සකස් කරන ලදී. |
| 2021 මාර්තු | - | කොටස් වෙළඳපොළේ ආයෝජකයින්ගේ පදනම පුළුල් කිරීමට ඩිජිටල් වේදිකා සඳහා පහසුකම් සලසන ලදී. |
| | - | කොළඹ කොටස් වෙළඳපොළෙහි අත්පිට වෙළඳපොළ (Over the Counter - OTC) වේදිකාව හරහා පත්‍ර රත්‍රන් (Paper Gold) හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2021 අප්‍රේල් | - | විශේෂ අරමුණු සහිත අත්පත් කර ගැනීමේ සමාගම් (Special Purpose Acquisition Companies) ලැයිස්තුගත කිරීම පහසු කිරීමේ යෝජනාවට ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |
| 2021 ජූනි | - | කොළඹ කොටස් වෙළඳපොළෙහි අත්පිට වෙළඳපොළ වේදිකාව (OTC) හරහා සාංගමික ණය සුරැකුම්පත්වල ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් (REPO) ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට මධ්‍යම තැන්පතු පද්ධති (CDS) නීති සංශෝධනය කරන ලදී. |
| | - | කොළඹ කොටස් වෙළඳපොළෙහි වැඩිදියුණු කළ ආන්තික පද්ධතිය (margining system) සහ ගෙවීම් හා කොටස් හුවමාරු වීමේ සමගාමී ක්‍රියාවලිය (Delivery vs Payment) යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමට නීතිරීති නිකුත් කිරීම සහ ආන්තික ආකෘතිය (marginal model) සංශෝධනය කිරීම තුළින් පහසුකම් සලසන ලදී. |
| | - | ඉස්ලාමීය ප්‍රාග්ධන වෙළඳපොළ නිෂ්පාදන හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |
| | - | ව්‍යුහාත්මක වරෙන්තු (Structured Warrants) හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |
| | - | හරිත බැඳුම්කර හඳුන්වා දීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |

| | | |
|---|---|---|
| | - | සමූහ අරමුදල් (crowdfunding) වැනි මාර්ගගත වේදිකා හරහා අරමුදල් රැස් කිරීමට පහසුකම් සැලසීම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දෙන ලදී. |
| | - | නව සුරැකුම්පත් හා විනිමය පනත් කෙටුම්පත බලාත්මක කිරීමේ ගැසට් නිවේදනය ප්‍රකාශයට පත් කෙරිණි. |
| 2021 ජූලි | - | කොටස් වෙළඳපොළ මෙහෙයුම් ඩිජිටල්කරණයේ දෙවන අදියර ආරම්භ කරන ලදී. |
| අපේක්ෂිත | - | අතරමැදි නීති (Intermediary Rules) ප්‍රතිසංස්කරණය කිරීම සඳහා විධාන නිකුත් කිරීම |
| | - | සුරැකුම්පත් ණයට ගැනීම හා ණයට දීම තුළින් ආවරණය කරන ලද කෙටි විකිණීම් (covered short selling) හඳුන්වා දීමට පහසුකම් සැලසීම |

## ගෙවීම් හා පියවීම්

| | | |
|---|---|---|
| 2021 ජූනි 09 | - | LANKAQR ක්‍රමවේදය සඳහා වෙළඳුන් වැඩි වශයෙන් සම්බන්ධ වීම දිරිමත් කිරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන, LANKAQR ගනුදෙනු සඳහා උපරිම වෙළඳ වට්ටම් අනුපාතය 0.5%ක් ලෙස පවත්වා ගැනීමේ කාලය තවත් මාස හයක කාලයක් දක්වා දීර්ඝ කරන ලද අතර එය 2021 වසරේ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වේ. |
| අපේක්ෂිත | - | ශ්‍රී ලංකාව තුළ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්ගේ කටයුතු නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ නියෝගයක් නිකුත් කිරීම |

## මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම

| | | |
|---|---|---|
| 2021 අප්‍රේල් 27 | - | මාර්ගගත ගෙවීම් ක්‍රමවේද හා සම්බන්ධ පාර්ශ්වයන් සඳහා මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2021 අංක 01 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2021 අප්‍රේල් 28 | - | ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර හරහා විදේශයන්හි දී සිදු කරන මුදල් ආපසු ගැනීම තුළින් විදේශ මුදල් පිටතට ගලා යාම හා සම්බන්ධ සැක කටයුතු ගනුදෙනු ඉහළ යෑමේ ප්‍රවණතාව සැලකිල්ලට ගනිමින්, 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති ප්‍රකාරව ගනුදෙනුකරුවන් සමඟ ව්‍යාපාරික සම්බන්ධතාවලට එළඹීමේ දී සහ ගනුදෙනු සිදු කිරීමේ දී නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ යුතු බවට උපදෙස් දෙමින් 2021 අංක 02 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2021 මැයි 04 | - | කොවිඩ්-19 වසංගතයේ තෙවන රැල්ල පැවති කාලපරිච්ඡේදය තුළ ඇති වූ මුදල් විශුද්ධිකරණය/ත්‍රස්තවාදයට මුදල් සැපයීම හා සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා අතිරේක ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳ 2021 අංක 03 දරන චක්‍රලේඛය නිකුත් කරන ලදී. |
| 2021 ජූනි 08 | - | සැක කටයුතු ගනුදෙනු වාර්තාකරණයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිළිබඳ 2021 අංක 01 දරන මාර්ගෝපදේශය මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2021 ජූලි 20 | - | මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ කාර්යයන් සඳහා සීසීටීවී (CCTV) මෙහෙයුම් පිළිබඳ 2021 අංක 2 දරන මාර්ගෝපදේශය මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2021 අගෝස්තු 12 | - | 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(2) වගන්තිය අනුව ගනුදෙනු අත්හිටුවීම පිළිබඳ 2021 අංක 03 දරන මාර්ගෝපදේශය මූල්‍ය ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2021 ඔක්තෝබර් 04 | - | 2021 අංක 18 දරන මුදල් පනත යටතේ සිදු කරනු ලබන තැන්පතු පිළිබඳ 2021 අංක 04 දරන චක්‍රලේඛය බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |

## විදේශ විනිමය කළමනාකරණය සහ ජාත්‍යන්තර කටයුතු

2021 ජනවාරි 01 - බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ පදිංචි, විදේශ ව්‍යවහාර මුදලින් ආදායම් උපයන සේවාවක නියුතු ශ්‍රී ලාංකිකයෙකු විසින් විදේශ ව්‍යවහාර මුදලින් උපයන ආදායම් සහ විදේශ රටක දී සේවා සැපයීම තුළින් උපයන විදේශ මුදල් ආදායම් මෙම යෝජනා ක්‍රමය යටතට ඇතුළත් වන පරිදි විෂය පථය පුළුල් කරන ලෙසට සහ 2020 දෙසැම්බර් 28 වන දින හෝ ඊට පසුව සිදු කරන ලද විදේශ මුදල් ආදායම් පරිවර්තන සඳහා මෙම යෝජනා ක්‍රමය බලාත්මක කිරීමට බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් ලබා දෙන ලදී.

2021 ජනවාරි 15 - කොන්දේසිවලට යටත්ව විදේශීය ණය නැවත ගෙවීමේ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් සඳහා අදාළ වන විදේශ විනිමය අවදානම වැළැක්වීමට තාවකාලික විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කර පවත්වාගෙන යාමට අවසර ලබා දෙමින් බලයලත් වෙළඳුන් වෙත 2021 විධාන අංක 01 නිකුත් කරන ලදී.

2021 ජනවාරි 27 - විදේශීය සංචිත ගොඩනැංවීම සඳහා බලපත්‍රලාභී බැංකුවල පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් 10%ක් අනිවාර්ය පදනම මත ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීම සඳහා වන යෝජනා ක්‍රමයක් හඳුන්වා දීමට අදාළව මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 03 - දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා බලයලත් වෙළෙඳුන්ගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා පැවති නියෝග හා නියමයන් අවලංගු කරමින් 2021 මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් නියෝග හා නියමයන් නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 01 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන වර්ග ගනුදෙනු සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 02 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/35 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 03 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග සඳහා අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 04 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අදාළ වන නියෝග දක්වමින් 2021 අංක 05 දරන විදේශ විනිමය නියෝග (අංක 2213/38 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් විදේශ ව්‍යවහාර මුදල් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල්, අපනයනය කිරීම හෝ ආනයනය කිරීම මත 2020 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 8 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.
- "ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන්" නිශ්චය කිරීම සඳහා විදේශ විනිමය පනතෙහි 31 වන වගන්තිය යටතේ වූ නියමය (අංක 2213/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය) නිකුත් කරන ලදී.

2021 පෙබරවාරි 18 - අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ලැබීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීති සංශෝධනය කෙරිණි. ඒ අනුව, සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම අපනයනයන්ට අදාළ මුදල්, අදාළ භාණ්ඩ නැව්ගත කළ දින සිට දින 180ක් ඇතුළත ශ්‍රී ලංකාව වෙත බලපත්‍රලාභී බැංකුවක් මගින් එකී අපනයනය මගින් ලද මුළු මුදලින් 25%ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතුය (අංක 2215/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

- 1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ, 2021 පෙබරවාරි 18 දින නිකුත් කළ ගැසට් නිවේදනය සහ රීති යටතේ, විදේශ සංචිත ගොඩනැංවීමේ අරමුණින් අපනයන ආදායම් ලැබීම්වලින් 25%ක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය කළ අතර එම පරිවර්තනවලින් 50%ක් බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණිය යුතු බව දක්වමින් යෝජනා ක්‍රමයක් හඳුන්වා දීම සඳහා මෙහෙයුම් උපදෙස් නිකුත් කරන ලදී.

2021 මාර්තු 09 - පරිවර්තනය සඳහා අදාළ වන කාල සීමාව දින 14ක් දක්වා දීර්ඝ කිරීම සඳහා මුදල් නීති පනත යටතේ 2021 අංක 2 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2218/38 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 මාර්තු 17 - පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් 10%ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවීම සඳහා "අභ්‍යන්තර සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" යටතේ බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කර තිබූ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

- පැවති වෙළඳපොළ තත්ත්වයන් සැලකිල්ලට ගෙන, අනිවාර්යයෙන් පරිවර්තනය කළ යුතු අපනයන ආදායම වන 25%න් 50%ක් ශ්‍රී ලංකා මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය තාවකාලිකව අත්හිටුවීම සඳහා "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" යටතේ බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කර තිබූ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

2021 මාර්තු 18 - 2021 පෙබරවාරි 03 දින නිකුත් කරන ලද නියෝගවලට හා නියමයන්ට සමගාමීව බලයලත් වෙළඳුන් වෙත පහත සඳහන් විධාන (2021 වසරේ මාර්තු 22 දින සිට ක්‍රියාත්මක වන පරිදි) නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් වෙනුවෙන් බලයලත් වෙළෙඳුන් විසින් සිදු කරන ජංගම ගනුදෙනු සඳහා විදේශ විනිමය පනතේ 6 වන වගන්තිය යටතේ 2021 අංක 02 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ සිටින හෝ ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන්ට සිදු කරනු ලබන විදේශ විනිමය ගෙවීම් සඳහා විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් භාවිත කිරීම සම්බන්ධයෙන් 2021 අංක 03 දරන විධාන නිකුත් කරන ලදී.
- සුදුසුකම් ලත් ශ්‍රී ලංකාවේ නේවාසික/අනේවාසික පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 04 දරන විධාන නිකුත් කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ නේවාසික විදේශ විනිමය උපයන්නන් විසින් සිදු කරන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 05 දරන විධාන නිකුත් කරන ලදී.
- රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල පුද්ගලයන් විසින් විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම්වලට අදාළව 2021 අංක 06 දරන විධාන නිකුත් කරන ලදී.
- "ශ්‍රී ලංකාව මගේ සිහින නිවහන" වැඩසටහන යටතේ නේවාසික වීසා බලපත්‍ර මත

දීර්ඝ කාලයක් ශ්‍රී ලංකාවේ වාසය කිරීමට කැමති සහ වයස අවුරුදු 55ට වැඩි ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ විදේශීය ජාතිකයන්ගේ විශේෂ ගිණුම්වලට අදාළව 2021 අංක 07 දරන විධාන නිකුත් කරන ලදී.

- ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද "නේවාසික ආගන්තුක යෝජනා ක්‍රමය" යටතේ ශ්‍රී ලංකාවට පැමිණෙන ආයෝජකයන් හා වෘත්තිකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නේවාසික ආගන්තුකයින් සඳහා වන යෝජනා ක්‍රමයේ විශේෂිත ගිණුම්වලට අදාළව 2021 අංක 08 දරන විධාන නිකුත් කරන ලදී.

- බලයලත් වෙළෙඳුන් විසින් ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමි විදේශ විනිමය උපයන්නන් හට ණය පහසුකම් ලබා දීම සඳහා ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ට සපයන ණය පහසුකම් සම්බන්ධයෙන් වන 2021 අංක 09 දරන විධාන නිකුත් කරන ලදී.

- බලයලත් වෙළෙඳුන් විසින් විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකික පුරවැසියන් හට විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය හා අත්තිකාරම් ප්‍රදානය කිරීම සඳහා විදේශයන්හි සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයන් (විගාමිකයන් හැර) හට ප්‍රදානය කරන ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් වන 2021 අංක 10 දරන විධාන නිකුත් කරන ලදී.

- බලයලත් වෙළෙඳුන් විසින් වෙනත් රටක ස්ථිර නේවාසිකත්වය සහ ද්විත්ව පුරවැසිභාවය හිමි ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදලින් හෝ ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ප්‍රදානය කිරීම සඳහා ස්ථිර නේවාසික වීසා බලපත්‍රය මත ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් හෝ ද්විත්ව පුරවැසිභාවය සහිත ශ්‍රී ලාංකිකයන් හට ප්‍රදානය කරන ණය සම්බන්ධයෙන් 2021 අංක 11 දරන විධාන නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මිලදී ගැනීම සහ අලෙවිය සඳහා අනුමත නියෝජිතයන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය අධිකාරී විසින් පත් කරන ලද බලයලත් වෙළෙඳුන් හා ප්‍රාථමික වෙළෙඳුන් හට අවසර දීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සම්බන්ධයෙන් වන 2021 අංක 12 දරන විධාන නිකුත් කරන ලදී.

- බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු වාර්තා කිරීමේ අවශ්‍යතාවය දක්වමින් විදේශ විනිමය විකිණීම (ආකෘති පත්‍රය 1) සහ විදේශ විනිමය මිලදී ගැනීම (ආකෘති පත්‍රය 2) සම්බන්ධයෙන් වන 2021 අංක 13 දරන විධාන නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා ප්‍රේෂණ සිදු කිරීමට ශ්‍රී ලංකාවේ නේවාසිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 14 දරන විධාන නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාව තුළ සිදු කරන ප්‍රාග්ධන ගනුදෙනුවලට සම්බන්ධ ආමුඛ ප්‍රේෂණ සිදු කිරීමට අනේවාසික අයෝජකයන් විසින් ගිණුම් විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා ආමුඛ ආයෝජන ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 15 දරන විධාන නිකුත් කරන ලදී.

- සංක්‍රමණික දීමනාව ලබා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 16 දරන විධාන නිකුත් කරන ලදී.

- නියාමන අවශ්‍යතාවයන්ට යටත්ව ශ්‍රී ලංකාවෙන් උපයාගත් ජංගම ආදායම් ගෙන්වා ගැනීම සඳහා විගාමිකයන් විසින් ගිණුම විවෘත කිරීම හා පවත්වාගෙන යාම සඳහා විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම සම්බන්ධයෙන් වන 2021 අංක 17 දරන විධාන නිකුත් කරන ලදී.

- ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික විගාමිකයන් සහ ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථාපිත හෝ සංස්ථාපිත සංගම් ආයතන/සමාගම් විසින් ශ්‍රී ලංකා රුපියල් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙනයාම සඳහා අනේවාසික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 18 දරන විධාන නිකුත් කරන ලදී.
- විදේශීය ණය දෙන්නන්ගෙන් ලබා ගත් ණය මුදල් බැර කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සංස්ථාගත සමාගම් විසින් ගිණුම් විවෘත කිරීම හෝ පවත්වාගෙන යාම සඳහා විදේශ වාණිජ ණය ගැනීමේ ගිණුම් සම්බන්ධයෙන් වන 2021 අංක 19 දරන විධාන නිකුත් කරන ලදී.
- ජංගම හා ප්‍රාග්ධන ගනුදෙනු සම්බන්ධයෙන් ඇපකර නිකුත් කිරීම සහ අලුත් කිරීම සඳහා අදාළ වන විධාන දක්වමින් 2021 අංක 20 දරන විධාන නිකුත් කරන ලදී.

2021 මාර්තු 26 - ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගේ අතැති විදේශ මුදල් විධිමත්ව ආකර්ශණය කර ගැනීමේ පියවරක් ලෙස දේශීය හෝටල් ගාස්තු විදේශ මුදලින් ගෙවීමට අවස්ථාව සලසා දෙමින්, විදේශ මුදල් තමා සන්තකයේ ඇති ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්ගෙන් එම විදේශ මුදල් පිළිගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල්වලට අවසරය ලබා දීම සඳහා විදේශ විනිමය පනතේ 4 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව අංක 2220/69 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 07 - 2020 වසරේ අප්‍රේල් 08 වන දා සිට මාස 24ක කාල සීමාවක් ඇතුළත සුදුසුකම්ලත් පුද්ගලයන් විසින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමට අවසර ලබා දීම සඳහා අංක 2222/37 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 21 දරන විධානය නිකුත් කරන ලදී.

2021 අප්‍රේල් 09 - මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති තවදුරටත් සංශෝධනය කරමින්, අපනයනවලින් ලද මුදල් පරිවර්තනය සඳහා අදාළ වන කාල සීමාව දින 30ක් දක්වා දීර්ඝ කිරීමට සහ පරිවර්තන අවශ්‍යතාවය 10%ක් දක්වා අඩු කිරීමට අදාළව 2021 අංක 3 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2222/60 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 මැයි 04 - සපයන ලද සේවාවක් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයෙකුගෙන් විදේශ මුදල් පිළිගැනීමට ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි හෝටල් වෙත අවසරය ලබා දෙමින් 2021 අංක 22 දරන විධාන නිකුත් කරන ලදී.

2021 මැයි 25 - 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සමාගම් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ පූර්ණ අවසරය සහිතව, විදේශ විනිමය ඉපැයීම් සහිත තම සමාගමේ පාලිත සමාගම්වලට විදේශ මුදලින් ණය ලබා දීම සඳහා අදාළ වන අවසරය ලබා දෙමින් විදේශ විනිමය පනතේ 4 වැනි වගන්ති ප්‍රකාරව අංක 2229/5 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 මැයි 28 - මුදල් මණ්ඩලය විසින් සිය අභිමතය පරිදි 10%කට නොඅඩු ප්‍රතිශතයක් දක්වා අර්ධ නිදහස් කිරීම් ලබා දීමට අදාළ ප්‍රතිපාදන සමඟ පරිවර්තන අවශ්‍යතාවය 25% දක්වා ඉහළ නැංවීමට අදාළව 2021 අංක 4 දරන අපනයනය මගින් ලද මුදල් ශ්‍රී ලංකාව වෙත ගෙන ඒමේ රීති වශයෙන් අංක 2229/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- 2021 වසරේ ජනවාරි 27 වන දින බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "අභ්‍යන්තර සේවක ප්‍රේෂණ සඳහා දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස් නැවත ස්ථාපිත කරන ලදී.

- 2021 වසරේ පෙබරවාරි 18 වන දින බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලද "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් නැවත ස්ථාපිත කරන ලදී.

2021 ජූනි 11 - ගිණුම්හිමියාගේ දේශීය වියදම් සඳහා විදේශ මුදලින් ආපසු ගැනීම අවසරලත් හර කිරීමක් වශයෙන් ඇතුළත් කරමින් රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සහ රාජ්‍යතාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 23 දරන විධාන නිකුත් කරන ලදී.

2021 ජූනි 17 - 2021 අංක 05 දරන විධානයන්හි ඇමුණුම I සංශෝධනය කරමින් ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්වලට අදාළව 2021 අංක 24 දරන විධාන නිකුත් කරන ලදී.

2021 ජූනි 30 - සමුච්චිත කාල සීමාව, තැන්පතුව ආරම්භ කළ මුල් දිනයේ සිට මාස 24ක් නොඉක්මවන පරිදි මාස 6 සහ මාස 12 යන කාල සීමා සඳහා දැනටමත් ආරම්භ කර ඇති විශේෂ තැන්පතු ගිණුම්වල යළි ආයෝජනය කිරීමට අදාළ රෙගුලාසි වශයෙන් අංක 2234/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයෙකුගෙන් විදේශ මුදලින් ණය ලබා ගත්, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද සමාගම්වලට, නියමයන් සහ කොන්දේසිවලට යටත්ව එකී ණය මුදලෙන් 50%ක් භාවිතා කරමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ද්විතීයික වෙළෙඳපොළෙන් මිලට ගැනීමට අවසර ලබා දෙන රෙගුලාසි වශයෙන් අංක 2234/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 ජූලි 02 - මාස හයක කාලසීමාවක් සඳහා ප්‍රතිමුඛ ප්‍රේෂණ සිදු කිරීමේදී අනුගමනය කළ යුතු පහත ක්‍රියාමාර්ග දක්වමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නියෝග ලෙස අංක 2234/49 දරන අති විශෙෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

- විගාමිකයාගේ සමීපතම පවුලේ සාමාජිකයෙකුගෙන් (විගාමිකයාගේ දෙමාපියන්, ආච්චි, සීයා, සහෝදර සහෝදරියන් සහ කලත්‍රයා) මුදල් ත්‍යාග ලෙස ලද අරමුදල්වලින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සිය රටට යැවීම අත්හිටුවීම.
- පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට හිමිකම්පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා තම සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සිය රටට යැවීම, එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, එ.ජ. ඩොලර් 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- ඕනෑම වර්තන ආදායමක් හෝ සමුච්චිත ආදායමක් (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල, පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ඕනෑම විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හරහා ආපසු සිය රටට යැවීම, එ.ජ. ඩොලර් 30,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ. ඩොලර් 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයෙකු සඳහා එ.ජ. ඩොලර් 10,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.

- පහත දක්වා ඇති අවස්ථාවල දී හැර ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජන සිදු කිරීමට පොදු අවසරය යටතේ ප්‍රතිමුඛ ආයෝජන ගිණුමක් හරහා සිදු කරන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම.
  - පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ
  - පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ
  - ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩොලර් 15,000ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ
  - සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ. ඩොලර් 30,000ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.
- ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, එ.ජ. ඩොලර් 20,000 හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් වර්ගයකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කිරීම.
- පොදු අවසරයෙහි දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී එක් එක් ආයෝජනය මත පදනම්ව, පනතෙහි 7(10) වගන්ති ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබිණි.
  - පනතෙහි විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුගෙන් ලබා ගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම, හෝ
  - පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවයක් සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

2021 ජූලි 06 - විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) 2021 අංක 02 දරන රෙගුලාසි (අංක 2213/35 දරන අති විශේෂ ගැසට් නිවේදනය) සංශෝධනය කරමින් කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත, ශ්‍රී ලංකා රුපියල්වලින් සහ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් වන ණය සුරැකුම්පත්වල ආයෝජනය සම්බන්ධ විධිවිධාන ඇතුළත් කරමින් පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝග ප්‍රකාරව අංක 2235/22 දරන අති විශේෂ ගැසට් නිවේදනය නිකුත් කරන ලදී.

2021 ජූලි 08 - 2021 අංක 21 දරන විධාන අහෝසි කරමින් විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීමේ හා පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 25 දරන විධානය නිකුත් කරන ලදී.

| | | |
|---|---|---|
| 2021 ජූලි 30 | - | කොළඹ කොටස් හුවමාරුව තුළ විදේශ විනිමය ආයෝජන සඳහා අවශ්‍ය පහසුකම් සලසමින් හඳුන්වා දුන් විශේෂ විදේශ මුදල් ගිණුම් විවෘත කිරීමේ සහ පවත්වාගෙන යාමේ නිර්ණායක, අවසරලත් හර කිරීම් සහ බැර කිරීම් සහ වෙනත් අවශ්‍යතා දක්වමින් බලයලත් වෙළෙඳුන්ට 2021 අංක 26 දරන විධාන නිකුත් කරන ලදී. |
| | - | කොළඹ කොටස් හුවමාරුවේ ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් ලැයිස්තුගත කොටස් හෝ ණය සුරැකුම්පත්වල සිදු කරන ලද ආයෝජනයකින් පැන නගින ඕනෑම ආදායමක් හෝ කල් පිරීමේ ප්‍රතිලාභයක් වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම සඳහා ගිණුම්හිමියා විසින් 2021 අංක 26 දරන විධාන යටතේ විවෘත කර පවත්වා ගෙන යන විශේෂ විදේශ මුදල් ගිණුම්වලට තම විදේශ විනිමය ඉපැයීම් මාරු කිරීම, 2021 වසරේ මාර්තු 18 දිනැති 2021 අංක 05 දරන ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම් සඳහා වන විධානයන්හි දක්වා ඇති අවසරලත් හර කිරීම්වලට අමතරව අවසරලත් හර කිරීමක් වශයෙන් ඇතුළත් කරමින් 2021 අංක 27 දරන විධාන නිකුත් කරන ලදී. |
| 2021 අගෝස්තු 06 | - | "අපනයන මගින් ලද ආදායම් අපනයනකරුවන්ගේ අදාළ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත බැර කිරීම" සම්බන්ධව බලපත්‍රලාභී බැංකු වෙත මෙහෙයුම් උපදෙස් නිකුත් කෙරිණි. ඒ අනුව, ලේඛනගත කිරීම සම්පූර්ණ වන තෙක්, ආපසු ගැනීම සහ/හෝ හැරවීම පිළිබඳව කොන්දේසිවලට යටත්ව, අපනයන උත්පාදන බැංකුවල පවත්වා ගෙන යන අදාළ අපනයනකරුවන්ගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම/ගිණුම් වෙත වහාම බැර කරන මෙන් සියලු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත උපදෙස් දෙන ලදී. |

## ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි

| | | |
|---|---|---|
| 2021 ජනවාරි 05 | - | 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ටයර් ආනයනවලට සම්බන්ධ භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2209/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |
| 2021 පෙබරවාරි 11 | - | 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින පිඟන් මැටි නිෂ්පාදන සහ සාරි ආශ්‍රිත භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2214/56 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |
| 2021 අප්‍රේල් 06 | - | 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින පාම් තෙල් ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2222/31 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |
| 2021 අප්‍රේල් 23 | - | 2020 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ජංගම වැඩපළ ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2224/43 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |
| | - | 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ජංගම වැඩපළ ආශ්‍රිත ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2224/44 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |
| 2021 මැයි 06 | - | ඛනිජමය හෝ රසායනික පොහොර ඇතැම් ආනයන තහනම් කරමින් සහ අවශේෂ ඛනිජමය හෝ රසායනික පොහොර ආනයන මත ආනයන සීමා බලපත්‍ර පනවමින්, 2021 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2226/48 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී. |

2021 ජූනි 11 - රත්‍රන් සහ මුහුණු ආවරණ ආනයන කිරීම් මත ආනයන සීමා බලපත්‍ර පනවමින්, 2021 අංක 08 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

- ඔක්සිජන් සහ ශ්වසන උපකරණ අපනයන කිරීම් මත සීමා පනවමින්, 2021 අංක 09 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/17 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

- 2020 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ආනයන සීමා කිරීම් යටතේ පවතින ආනයන භාණ්ඩ ලැයිස්තු සංශෝධනය කරමින්, 2021 අංක 10 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2231/18 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

2021 ජූලි 31 - ඛනිජමය හෝ රසායනික පොහොර ආනයනය කිරීම් "ආනයන සීමා බලපත්‍ර" කාණ්ඩය යටතේ සිට "තහනම්" කාණ්ඩය යටතට ගෙන යමින්, 2021 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (අංක 2238/45 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත) නිකුත් කරන ලදී.

## මිල සංශෝධන

අයිතම කිහිපයක උපරිම සිල්ලර මිල ගණන් පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.02.08 | සුදු සීනි, වියළි මිරිස් (කුඩු නොකළ හෝ නොඇඹරූ), අර්තාපල් (ආනයනික), කිරි සම්බා | උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. |
| 2021.06.18 | පොල් (වට ප්‍රමාණය අඟල් 13ට වැඩි, වට ප්‍රමාණය අඟල් 12-13 අතර, වට ප්‍රමාණය අඟල් 12ට අඩු) | උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. |
| 2021.07.25 | ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව අඩංගු ලීටර් 18 (කිලෝග්‍රෑම් 9.6) ගෑස් සිලින්ඩර | දිස්ත්‍රික්ක මත පදනම්ව උපරිම සිල්ලර මිල ගණන් පනවන ලදී. |
| 2021.08.12 | පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (PCR) | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 6,500ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | ක්ෂණික ප්‍රතිදේහජනක පරීක්ෂණය (RAT) | එක් පරීක්ෂණයක් හා වාර්තාවක් සඳහා රුපියල් 2,000ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2021.09.02 | සුදු සීනි | ආනයනකරු විසින් විකිණිය යුතු උපරිම තොග මිල කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 116කි. |
| | සුදු සීනි (ඇසුරුම් නොකළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 122ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | සුදු සීනි (ඇසුරුම් කළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | දුඹුරු හෝ රතු සීනි (ඇසුරුම් නොකළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 125ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | දුඹුරු හෝ රතු සීනි (ඇසුරුම් කළ) | කිලෝග්‍රෑමයක් සඳහා රුපියල් 128ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| | කිරි සම්බා | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 120 සිට රුපියල් 125 දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 98 සිට රුපියල් 103 දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් සහ අට්ටික්කාරී හැර) | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 96 සිට රුපියල් 98 දක්වා ඉහළ නංවන ලදී. |
| | සුදු/රතු කැකුළු සහල් | කිලෝග්‍රෑමයක උපරිම සිල්ලර මිල රුපියල් 93 සිට රුපියල් 95 දක්වා ඉහළ නංවන ලදී. |

| දිනය | අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.09.04 | ෆින්ගර් ටිප් පල්ස් ඔක්සිමීටරය | ඒකකයකට රුපියල් 3,000ක උපරිම සිල්ලර මිලක් පනවන ලදී. |
| 2021.09.29 | කීරි සම්බා සුදු/රතු සම්බා - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (සුදුරු සම්බා හැර), සුදු/රතු නාඩු - වාෂ්පයෙන් තැම්බූ/තම්බන ලද (මොට්ටෙයිකරුපන් හා අට්ටික්කාරී හැර), සුදු/රතු කැකුළු සහල් සහ සුදු/රතු කැකුළු සම්බා | උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. |
| 2021.10.08 | කිරි පිටි (සම්පූර්ණ යොදය සහිත කිරි පිටි, යොදය රහිත කිරි පිටි සහ ළදරු කිරි පිටි), සිමෙන්ති, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායුව සහ තිරිඟු පිටි | උපරිම සිල්ලර මිල ගණන් ඉවත් කරන ලදී. |

## බදු සංශෝධන

### ආදායම් බදු

2021 මැයි 13 - ප්‍රධාන වශයෙන් ම, 2020 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රකාශයට පත් කළ අයවැය යෝජනා සහ 2020 වසරේ ජනවාරි මාසයේ දී සහ 2021 වසරේ අප්‍රේල් මාසයේ දී සිදු කළ අනෙකුත් නිවේදන නීතිගත කිරීම සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත, 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.

### එකතු කළ අගය මත බදු

2021 පෙබරවාරි 01 - 2021 වසරේ ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත අපනයනය පදනම් කර ගත් සමාගම් විසින් ඇතැම් ඇගලුම් (HS කේත අංක අඩංගු පරිච්ඡේද අංක 61, 62 සහ 63 යටතේ වර්ගීකරණය කරන ලද) දේශීයව විකිණීමේ දී, ඒකක මත පදනම් කර ගත් එකතු කළ අගය මත බදු අනුපාතිකය රුපියල් 100 සිට රුපියල් 25ක් දක්වා අඩු කරන ලදී (දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මහජන දැන්වීම - PN/VAT/2021-01).

2021 මැයි 13 - ප්‍රධාන වශයෙන් ම, 2019 වසරේ දෙසැම්බර් මස සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතිකය අඩු කිරීම සහ 2020 වසරේ ජනවාරි මස සිට බලපැවැත්වෙන පරිදි එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව ඉහළ නැංවීම යනාදිය නීතිගත කිරීම සඳහා, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත, 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් සංශෝධනය කරන ලදී.

### නිෂ්පාදන/සුරා බදු

2021 ජනවාරි 01 - සංචාරක මණ්ඩලය අනුමත කරනු ලැබූ සහ සංචාරක මණ්ඩල අනුමැතිය රහිත කාමර 5 හෝ ඊට වැඩි හෝටල් බලපත්‍රය (ර.බී.7), හෝටල් පීඨිකා බලපත්‍රය (ර.බී.8), භෝජනාගාර බලපත්‍රය (සංචාරක මණ්ඩලයේ අනුමැතිය සහිත/අනුමැතිය රහිත - ර.බී.11), තානායම් බලපත්‍රය (ර.බී.12) සහ ස්ථානීය පරිභෝජනය (ර.බී.22බී) (සංචාරක මණ්ඩලය විසින් අනුමැතිය සහිත/අනුමැතිය රහිත) සඳහා වාර්ෂික මද්‍යසාර බලපත්‍ර ගාස්තු ඉවත් කරන ලදී (අංක 2208/35 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 07 - ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් සඳහා වන සුරා බද්ද රුපියල් 50 සිට රුපියල් 25 දක්වා අඩු කරන ලදී (අංක 2209/42 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජනවාරි 11 - 2021 වසර සඳහා මද්‍යසාර භාවිතයට අය කරනු ලබන ගාස්තුවෙන් ඇතැම් හෝටල් නිදහස් කරන ලදී (අංක 2210/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 23 - ඊතයිල් මද්‍යසාර සඳහා වන සුරා බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී (අංක 2220/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය):

| අයිතමය | මසකට දේශීයව සපයනු ලබන/ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | පෙර පැවති බද්ද 2020.06.09 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්) | | බදු සංශෝධනය 2021.03.23 වන දින සිට බලපැවැත්වෙන පරිදි (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|---|---|
| | | දේශීයව සපයනු ලබන | ආනයනික | දේශීයව සපයනු ලබන | ආනයනික |
| නිෂ්පාදන සඳහා භාවිත වන ඊතයිල් මද්‍යසාරඃ | | | | | |
| (අ) දේශීය අලෙවිය සඳහා වන සනීපාරක්ෂක ද්‍රව්‍ය | ලීටර් 500 දක්වා | නිදහස් | 200 | නිදහස් | 200 |
| | ලීටර් 501 සිට ලීටර් 10,000 දක්වා | | 700 | | 700 |
| | ලීටර් 10,001 සිට ලීටර් 20,000 දක්වා | | 800 | | 800 |
| | ලීටර් 20,000ට වැඩි | | 1,200 | - | - |
| | ලීටර් 20,001 සිට ලීටර් 100,000 දක්වා | - | - | නිදහස් | 1,200 |
| | ලීටර් 100,000 ට වැඩි | - | - | 100 | 1,200 |
| (ආ) අපනයනය සඳහා වන සනීපාරක්ෂක ද්‍රව්‍ය | සෑම ලීටරයකටම | නිදහස් | 25 | 25 | 25 |

## නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)

2021 අප්‍රේල් 05 - ශ්‍රී ලංකා පොලීසිය අයත් වන රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව, ශ්‍රී ලංකා පොලීසියට ත්‍රී රෝද රථ 2,000ක් මිල දී ගැනීම, නිෂ්පාදන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2222/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

- වාහන නිෂ්පාදනය කිරීමේ/එකලස් කිරීමේ කර්මාන්තය සහ වාහන උපාංග නිෂ්පාදනය කිරීමේ කර්මාන්තය සඳහා වන සම්මත මෙහෙයුම් පටිපාටිය ක්‍රියාත්මක කිරීමට සමගාමීව දේශීයව එකලස් කරන ලද/නිෂ්පාදනය කරන ලද මෝටර් රථ හා යතුරු පැදි සඳහා නව බදු ව්‍යුහයක් හඳුන්වා දෙන ලදී (අංක 2222/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අප්‍රේල් 22 - ජංගම වැඩපළ මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු අනුපාතික සංශෝධනය කරන ලදී (අංක 2224/24 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අගෝස්තු 03 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත, භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතියට යටත්ව, අත්‍යවශ්‍ය ක්ෂේත්‍ර කටයුතු සඳහා අවශ්‍ය වතුර බවුසර් 52ක් සහ ඩබල් කැබ් රථ 62ක් ආනයනය කිරීම, නිෂ්පාදන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2239/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

## ආනයන තීරු බදු

පෙට්‍රල් හා ඩීසල් ආනයනය සඳහා වන ආනයන තීරු බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| අයිතමය | දිනය | ආනයන තීරු බද්ද (ලීටරයට රුපියල්) | ආනයන තීරු බදු සහනය (ලීටරයට රුපියල්) | අදාළ තීරු බද්ද (ලීටරයට රුපියල්) |
|---|---|---|---|---|
| පෙට්‍රල් (92 ඔක්ටේන්) | 2020.12.31 | 50.00 | 18.00 | 32.00 |
| | 2021.02.02 | 50.00 | 29.00 | 21.00 |
| | 2021.03.25 | 50.00 | 45.00 | 5.00 |
| පෙට්‍රල් (95 ඔක්ටේන්) | 2020.12.31 | 50.00 | 16.00 | 34.00 |
| | 2021.02.02 | 50.00 | 8.00 | 42.00 |
| | 2021.03.25 | 50.00 | 24.00 | 26.00 |
| සුදු ඩීසල් | 2020.12.31 | 25.00 | 20.00 | 5.00 |
| | 2021.02.02 | 25.00 | 14.00 | 11.00 |
| | 2021.03.25 | 25.00 | 25.00 | 0.00 |
| සුපිරි ඩීසල් | 2020.12.31 | 25.00 | 15.00 | 10.00 |
| | 2021.02.02 | 25.00 | - | 25.00 |
| | 2021.03.25 | 25.00 | 10.00 | 15.00 |

සටහන: 2020 වසරේ නොවැම්බර් 24 වන දින සිට මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි පනවන ලද අධිභාරය 2021 වසරේ පෙබරවාරි 02 වන දින ඉවත් කරන ලදී.

## සෙස් බද්ද

2021 ජනවාරි 12 - ආනයනික අමුද්‍රව්‍ය යොදා ගනිමින් අපනයනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය කරන, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුම්ගත සහ රේගු බන්ධිත ගුදම් තුළ වන නිෂ්පාදන වැඩපිළිවෙළ (Customs Manufacture-in-Bond Scheme) හෝ අපනයන සඳහා තාවකාලික අපනයන වැඩපිළිවෙළ (Temporary Importation for Export Processing (TIEP) Scheme) යටතේ ලියාපදිංචි වී ඇති ව්‍යවසායයන් විසින් එම අපනයන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලියෙන් සහ අලුත්වැඩියා/නඩත්තු ක්‍රියාවලිය තුළින් ජනිත වන සුන්බුන්/ඉවතලන දෑ අපනයනය කිරීම, සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2210/09 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 15 - පිඟන් ගඩොල් සහ සනීපාරක්ෂක භාණ්ඩ ආනයනය මත වන සෙස් බද්ද සංශෝධනය කරන ලදී (අංක 2219/15 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 17 - 2019 වසරේ මාර්තු 06 දින හෝ එදිනට පසුව සෑම අදියරකදීම එ.ජ. ඩොලර් මිලියන 50ක් හෝ ඊට වැඩි මුදලක් ව්‍යාපෘතියක් මත ආයෝජන කරන, ඕනෑම ව්‍යවසායයක් සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් මගින් එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කාල සීමාව හෝ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම අතරතුර නමුත් වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, ආනයනය කරනු ලබන ඕනෑම භාණ්ඩයක් සෙස් බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2219/36 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

## විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද

ආනයනික භාණ්ඩ කිහිපයක් සඳහා වන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පහත පරිදි සංශෝධනය කරන ලදී.

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.01.13 | බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සහ උක් සීනි, සීනි (එකතු කළ රසගන්වනය හෝ වර්ණකාරක දෑ අඩංගු) සහ සුදු ස්ඵටිකකෘත උක් සහ බීට් සීනි | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2210/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.01.18 | පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි බීජ, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්), උඳු පිටි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2211/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.02.11 | හාල්මැස්සන් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයකට රුපියලේ සිට කිලෝග්‍රෑමයකට රුපියල් 100ක් දක්වා ඉහළ නංවන ලදී (අංක 2214/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | කරවල, අර්තාපල් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඩු කරන ලදී (අංක 2214/58 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.03.03 | මැකරල්, ජැක් හෝ හෝස් මැකරල් මාළු, උඳු, කව්පි, මෙනේරි සහ කුරක්කන් | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2217/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.04.13 | බොම්බයි ළූණු, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියළ කළ), බීට් සහ උක් සීනි, සීනි (එකතු කළ රසගන්වනය හෝ වර්ණකාරක දෑ අඩංගු) සහ සුදු ස්ඵටිකකෘත උක් සහ බීට් සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2223/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.04.26 | මාළු (අලුත්, ශීත කළ හෝ හිමායිත), උම්බලකඩ, මුං ඇට (මුං), මැංගුස්ටීන් (අලුත් සහ වියළි) සහ කිවි ෆෲට් | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2225/1 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.04.27 | දිසිදි පොල් | මාස තුනක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 300ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2225/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | අර්තාපල් | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රුපියල් 15 සිට කිලෝග්‍රෑමයට රුපියල් 50 දක්වා ඉහළ නංවන ලදී (අංක 2225/13 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.05.17 | යෝගට්, රතු ළූණු, සුදු ළූණු, කොණ්ඩ කඩල (සම්පූර්ණ සහ පියළි කළ), කඩල (සම්පූර්ණ සහ පියළි කළ), රට ඉඳි (අලුත් සහ වියළි), දොඩම් (අලුත් සහ වියළි), ලෙමන් (අලුත් සහ වියළි), මිදි (අලුත් සහ වියළි), ඇපල්, ක්වීන්සස්, මිරිස් (වියළි, කුඩු නොකළ), මිරිස් (කුඩු කළ හෝ ඇඹරූ), සුදුරු බීජ, මහදුරු බීජ, බඩ ඉරිඟු, රට කජු (පොතු හරින ලද), මාජරින්, ටින් මාළු සහ මුහුණු ආවරණ | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2228/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

| දිනය | අදාළ අයිතමය | සංශෝධනය |
|---|---|---|
| 2021.06.14 | ක්ලෙමන්ටයින් (අලුත් සහ වියළි), මහසිදරන්, පොමෙලොස් ඇතුළුව (අලුත් සහ වියළි), පෙයාර්ස්, ඇප්‍රිකොට්, ඇඹුල් චෙරීස් (ප්‍රූනුස් සෙරාසස්), චෙරීස් (අනෙකුත්), පීචස් (නෙක්ටාරීන් ඇතුළුව), ප්ලම්ස් සහ ස්ලෝස්, එළවළු තෙල් හා පොල්තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් සහ මාජරින් (අනෙකුත්) | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2232/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.07.18 | පෙරහන් ගාන ලද හෝ පිටි කරන ලද කේජු, කොත්තමල්ලි, කහ (කුඩු නොකළ හෝ නොඇඹරූ සහ අනෙකුත්), උඳු පිටි | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2236/66 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.08.10 | හාල්මැස්සන්, කරවල, වෙඬරු, කිරිවලින් නිපද වූ තැවරුම්, උළුහාල් ඇට, කුරක්කන් පිටි, අබ ඇට සහ ලූණු | වසරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2240/20 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.09.07 | බොම්බයි ළූණු | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට සත 25 සිට කිලෝග්‍රෑමයට රුපියල් 40 දක්වා ඉහළ නංවන ලදී (අංක 2244/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.10.11 | කැකුළු සහල්, නාඩු සහල් (රතු හෝ සුදු) සහ සම්බා සහල් (රතු හෝ සුදු) | මාස හතරක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑමයට රුපියල් 65ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී (අංක 2249/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021.10.13 | අර්තාපල්, රතු සහ කහ පරිප්පු (සම්පූර්ණ සහ පියලි කළ), බීට් සහ උක් සීනි, සීනි (එකතු කළ රසගන්වනය හෝ වර්ණකාරක දැ අඩංගු) සහ සුදු ස්ඵටිකකෘත උක් සහ බීට් සීනි | මාස හයක කාලයක් සඳහා බලපැවැත්වෙන පරිදි විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද පැනවීම දීර්ඝ කරන ලදී (අංක 2249/16 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

## වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද

2021 පෙබරවාරි 22 - සීනි හෝ වෙනත් රසකාරක එක් කරන ලද හෝ සාන්ද්‍ර කරන ලද කිරි සහ යොදය (HS කේත අංක 0402.10.00, 0402.21.00 සහ 0402.29.00 යටතේ එන නිෂ්පාදන) මත පැන වූ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 10% සිට 2.5%ක් දක්වා අඩු කරන ලදී (අංක 2216/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 09 - 2008 අංක 14 දරන ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනත සහ වාණිජ කේන්ද්‍රස්ථාන නියෝග යටතේ අනුමත වූ ඕනෑම ව්‍යාපෘතියක් හැරුණු කොට, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹ ඇති, සෑම අදියරදීකම එ.ජ. ඩොලර් මිලියන 50කට නොඅඩු ප්‍රාග්ධන ආයෝජනයක් සිදු කරන ව්‍යාපාරවල, ඕනෑම ව්‍යාපෘතියක්, ක්‍රියාත්මක කරන අතර හෝ වාණිජ කටයුතු ආරම්භ කිරීමට පෙර, එම ව්‍යාපෘතීන්ට අදාළව ආනයනය කරනු ලබන ප්‍රාග්ධන භාණ්ඩ, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2218/51 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 19 - රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව, ඛනිජ තෙල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත, විශේෂයෙන් තාර නිෂ්පාදනය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ආනයනය කරන ලද උඳුන් තෙල්, වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2219/68 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අප්‍රේල් 19 - ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු මෙට්‍රික් ටොන් එකක මිල එ.ජ. ඩොලර් 325ට ළඟා වන තෙක්, ද්‍රවීකෘත පෙට්‍රෝලියම් වායු සඳහා වන 7.5%ක වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද,

7.5%ක් හෝ මෙට්‍රික් ටොන් එකකට රුපියල් 2,000 යන දෙකෙන් වඩා අඩු අගය ලෙස, සංශෝධනය කරන ලදී (අංක 2224/8 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 ජූනි 11 - අමු හෝ බදින ලද, සම්පූර්ණයෙන් හෝ කැබලි කළ කොකෝවා ඇට සඳහා වන වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද 10% සිට 5% දක්වා අඩු කරන ලදී (අංක 2231/19 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 අගෝස්තු 11 - සීනි හෝ වෙනත් රසකාරක එක් කරන ලද හෝ සාන්ද්‍ර කරන ලද කිරි සහ යොදය (HS කේත අංක 0402.10.00, 0402.21.00 සහ 0402.29.00 යටතේ එන නිෂ්පාදන) වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2240/21 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

## අනෙකුත් බදු සහ අයබදු

2021 ජනවාරි 05 - පාර්ලිමේන්තු කටයුතු විෂය භාර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ 8 වන පාර්ලිමේන්තුවේ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු විසින් ආනයනය කරන ලද මෝටර් රථයක් සුඛෝපභෝගී බද්දෙන් නිදහස් කරන ලදී (අංක 2209/23 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 පෙබරවාරි 09 - විදේශීය ටෙලි නාට්‍ය සහ චිත්‍රපට විකාශය මත ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද නැවතත් පනවන ලදී (අංක 2214/25 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මැයි 10 - ටෙලි නාට්‍ය, චිත්‍රපට සහ වාණිජ වැඩසටහන් බද්ද යටතේ වාණිජ වැඩසටහන් විකාශය සඳහා ගෙවිය යුතු බද්ද සංශෝධනය කරන ලදී (අංක 2227/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

| කාලය | පැවති බද්ද 2017.11.08 වන දින සිට බලපැවැත්වෙන පරිදි (රුපියල්) | සංශෝධිත බද්ද 2021.05.11 වන දින සිට බලපැවැත්වෙන පරිදි (රුපියල්) |
|---|---|---|
| යම් බලපත්‍රලාභී ආයතනයක් විසින් යම් වාර ගණනක් විකාශය කිරීම සඳහා, | | |
| • නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 30ක කාලපරිච්ඡේදයක් සඳහා | - | 100,000 |
| • නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 183ක කාලපරිච්ඡේදයක් සඳහා | 500,000 | 500,000 |
| • නිෂ්කාශන සහතිකයේ සඳහන් දින සිට දින 365ක කාලපරිච්ඡේදයක් සඳහා | 1,000,000 | 1,000,000 |

2021 සැප්තැම්බර් 15 - ඇතැම් නීති යටතේ හෙළිදරව් කිරීමට නියම කරන ලද, හෙළිදරව් නොකළ, බදු අය කළ හැකි සැපයුම්, ආදායම් සහ වත්කම් පිළිබඳව ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීමට පුද්ගලයන්ට ඉඩ ලබා දීම සඳහාත්, එලෙස ස්වේච්ඡාවෙන් හෙළිදරව් කළ සැපයුම්, ආදායම් සහ වත්කම් මත බද්දක් පැනවීම සඳහාත් 2021 අංක 18 දරන මුදල් පනත බලාත්මක කරන ලදී.

## අනෙකුත්

2021 ජනවාරි 05 - හම්බන්තොට ආරබොක්ක ප්‍රදේශයේ ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ කලාපයක් පිහිටුවීම (අංක 2209/22 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

2021 මාර්තු 05 - 'සිලෝන් ටයර් මැනුෆැක්චරින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්' පිහිටුවීමට අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කිරීම (අංක 2217/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය).

| | | |
|---|---|---|
| 2021 මාර්තු 23 | - | කොළඹ ජාත්‍යන්තර මූල්‍ය මධ්‍යස්ථානය (CIFC) මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියට අදාළ තොරතුරු ප්‍රකාශයට පත් කරන ලදී (අංක 2220/30 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021 අප්‍රේල් 19 | - | ඖෂධ නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ විශේෂිත කලාපය තුළ ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කරන ලදී (අංක 2224/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021 අප්‍රේල් 20 | - | රෙදිපිළි නිෂ්පාදනය කිරීම සඳහාම වෙන් කළ විශේෂිත කලාපය තුළ ඇති එක් එක් ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සහ ප්‍රදානය කරනු ලබන දිරි දීමනා නියම කරන ලදී (අංක 2224/9 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021 මැයි 21 | - | විවට වෙළඳපොළ කටයුතු හා නිත්‍ය පහසුකම් සම්බන්ධයෙන් වන 2021 අංක 01 දරන "වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සඳහා වන ඒකාබද්ධ මෙහෙයුම් උපදෙස්" පිළිබඳ චක්‍රලේඛය සහභාගිත්ව ආයතන වෙත නිකුත් කරන ලදී. |
| 2021 මැයි 24 | - | 'වෙල්කම් හොටෙල්ස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්' යන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2022 වසරේ ජනවාරි මස 01 දින සිට තවදුරටත් මාස 18කින් දීර්ඝ කරන ලදී (අංක 2229/2 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| | - | 'ඇවික් ඉන්ටර්නැෂනල් හොටෙල්ස් ලංකා ලිමිටඩ්' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2020 වසරේ මාර්තු මස 25 වන දින සිට තවදුරටත් මාස 19කින් දීර්ඝ කරන ලදී (අංක 2229/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |
| 2021 මැයි 27 | - | කොළඹ වරාය නගරය විශේෂ ආර්ථික කලාපය සහ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පිහිටු වීම සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී. |
| 2021 සැප්තැම්බර් 06 | - | 'වෝටර්ෆ්‍රොන්ට් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්' ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා දී ඇති කාල සීමාව 2021 වසරේ ඔක්තෝබර් 12 වන දින සිට තවදුරටත් මාස 14ක් සහ දින 20කින් දීර්ඝ කරන ලදී (අංක 2244/3 දරන අති විශෙෂ ගැසට් නිවේදනය). |

## රාජ්‍ය වියදම

| | | |
|---|---|---|
| 2021 ජූනි 23 | - | රුපියල් බිලියන 200ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී (අංක 80 දරන පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය). |
| 2021 අගෝස්තු 05 | - | රුපියල් බිලියන 11.8ක පරිපූරක ඇස්තමේන්තුවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී (අංක 89 දරන පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය). |
| 2021 අගෝස්තු 13 | - | මුදල් අමාත්‍යතුමා විසින් රුපියල් බිලියන 19ක විශේෂ නීති සේවා බලපත්‍රයක් අනුමත කරන ලදී. |
| 2021 අගෝස්තු 16 | - | ඕනෑම කර්මාන්තයක හෝ සේවාවක නියුතු සේවකයන් සඳහා වන ජාතික අවම මාසික වේතනය රුපියල් 10,000 සිට රුපියල් 12,500ක් දක්වා ඉහළ නැංවීමට සහ ජාතික අවම දෛනික වේතනය රුපියල් 400 සිට රුපියල් 500ක් දක්වා ඉහළ නැංවීම සඳහා 2021 අංක 16 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත මගින් 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත සංශෝධනය කරන ලදී. |
| 2021 ඔක්තෝබර් 07 | - | 2022 වසර සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. |
| | - | 2020 අංක 7 දරන විසර්ජන පනතෙන් අනුමත කරන ලද රුපියල් බිලියන 2,997ක් වන ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 3,397 දක්වා රුපියල් බිලියන 400කින් ඉහළ නැංවීම සඳහා වන විසර්ජන (සංශෝධන) කෙටුම්පත ප්‍රකාශයට පත් කරන ලදී. |

## රාජ්‍ය ණය කළමනාකරණය

| | | |
|---|---|---|
| 2021 ජනවාරි 26 | - | වෙළඳපොළ යථා තත්ත්වයට පත්ව ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළඳපොළෙන් අරමුදල් රැස් කිරීමට හැකි වන තෙක් භාණ්ඩාගාරයට අවශ්‍ය විදේශ අරමුදල් සම්පාදනය කිරීම පහසු කිරීම සඳහා ඇපකර හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර, ඍජු නිකුතු ක්‍රමය යටතේ බැංකු සඳහා නිකුත් කිරීමට සහ/හෝ විදේශ මුදල් මූලාශ්‍ර තත්ත්වයන් මත අරමුදල් සම්පාදනය කිරීමට කටයුතු කරන ලදී. |
| 2021 පෙබරවාරි 03 | - | භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි සඳහා පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතිකය දින 364 පරිණත කාලයට පමණක් ප්‍රකාශයට පත් කිරීමට හා දින 91 සහ දින 182 පරිණත කාලයන් සඳහා වන ඵලදා අනුපාතික දින 364 සඳහා තීරණය වන ඵලදා අනුපාතිකයට සමානුපාතික ඵලදා අනුපාතයන්ට අනුකූලව පිළිගැනීමටත්, සියලුම භාණ්ඩාගාර බැඳුම්කර පරිණත කාලයන් සඳහා වෙන්දේසියේ දී පිළිගනු ලබන උපරිම ඵලදා අනුපාතික ප්‍රකාශයට පත් කිරීම තවදුරටත් ක්‍රියාත්මක කිරීමටත් පියවර ගන්නා ලදී. |
| 2021 මාර්තු 26 | - | ද්විතියික වෙළඳපොළෙහි වෙළඳ භාවිතයන් වැඩිදියුණු කිරීම හා ශක්තිමත් කිරීම, වෙළඳාමේ විශ්වසනීයත්වය ඉහළ නැංවීම සහ ආයෝජකයන්ගේ ආරක්ෂාව සහ විශ්වාසය වැඩි කිරීම යන අරමුණු සහිතව ද්විතියික වෙළඳපොළෙහි සිදු වන සියලුම රජයේ සුරැකුම්පත් ගනුදෙනු, එම ගනුදෙනු සිදු කරන දිනයේදී ම වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. ඒ අනුව, ලංකා සෙට්ල් පද්ධතියේ සියලුම සහභාගිකරුවන් විසින් සිදු කරන සියලුම ගනුදෙනු, 2021 වසරේ අප්‍රේල් 01 දින සිට මහ බැංකුවට වාර්තා කිරීම, කළ යුතු විය. |
| 2021 මැයි 24 | - | මහ බැංකු භාණ්ඩාගාර බිල්පත් තොගයේ සතිපතා කල්පිරෙන ප්‍රමාණයෙන් රුපියල් බිලියන 5.0ක් හෝ 50%ක් එම දෙආකාරයෙන් වැඩිම ප්‍රමාණය මහ බැංකුව සතුව රඳවා ගැනීමට සහ මහ බැංකුව වෙත ලබා ගැනීමටත් ඉන්පසුව ගලපන ලද ප්‍රමාණය වෙළඳපොළ වෙත නිකුත් කිරීමටත් කටයුතු කරන ලදී. |
| 2021 ජූනි 07 | - | රුපියල අවප්‍රමාණය වීමේ අවදානම හරහා සිදු විය හැකි අවාසිදායක තත්ත්වයන් මග හැරීම සඳහා, පෞද්ගලික අංශය විසින් සිය ජාත්‍යන්තර සබඳතා හරහා විදේශ ණය ලබා ගැනීමේ මාර්ග කෙරෙහි යොමු කිරීම සහ එවන් විදේශ ණය අරමුදල් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජනය කිරීම දිරි ගැන්වීම සඳහා පියවර ගැනීම. |
| 2021 ජූනි 09 | - | විදේශයන්ගෙන් ලැබෙන අරමුදල් එ.ජ. ඩොලරයෙන් නාමනය කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ සමානව බෙදී යන සේ ආයෝජනය කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා අවශ්‍ය පහසුකම් සැපයීමට කටයුතු කිරීම තුළින් රට තුළ ආයෝජන අවස්ථා දිරිමත් කිරීමට සහ විදේශ මුදල් ගලා ඒම් තවදුරටත් ඉහළ නැංවීමට කටයුතු කරන ලදී. |
| 2021 ජූනි 14 | - | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2020 වසරේ දී ළඟා කර ගැනීමට අපේක්ෂිතව තිබූ ණය අනුපාතික ඉලක්කය 2030 වසර දක්වා දීර්ඝ කිරීම සහ රජය විසින් ලබා දෙන ණය ඇපකර සීමාව 10% සිට 15% දක්වා ඉහළ නැංවීම සඳහා 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) පනත, 2021 අංක 12 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම) සංශෝධන පනත මගින් සංශෝධනය කරන ලදී. |
| 2021 ජූනි 23 | - | භාණ්ඩාගාර බිල්පත් මාර්ගයෙන් ණය රැස් කර ගැනීමේ උපරිම ණය සීමාව පෙර පැවති රුපියල් බිලියන 2,000 සීමාවේ සිට රුපියල් බිලියන 3,000 දක්වා වැඩි කිරීම සඳහා යෝජනාවක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. (අංක 80 දරන පාර්ලිමේන්තු න්‍යාය පත්‍රය). |
| 2021 ජූලි 08 | - | විදේශ රටක සිටින පුද්ගලයෙකුගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගත් ණයවලින් 50%ක් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර තුළ හා ඉතිරි 50% ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර තුළ ආයෝජනය කිරීමට ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද සමාගම් සඳහා අවසර ලබා දීමට කටයුතු කරන ලදී. |

| | | |
|---|---|---|
| 2021 සැප්තැම්බර් 22 | - | 2021 වසරේ සැප්තැම්බර් මස 22 වන දින පැවැත් වූ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ සිට බලපැවැත්වෙන පරිදි පරිණත කාලය දින-364 සහිත භාණ්ඩාගාර බිල්පත් සඳහා උපරිම ඵලදා අනුපාතිකය ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. |
| 2021 සැප්තැම්බර් 23 | - | නව භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීමේ පද්ධතියේ තෙවන අදියර ක්‍රියාත්මක කිරීමට පළමු අදියරෙන් පිළිගත යුතු ප්‍රමාණය 80% දක්වා ඉහළ දැමූ අතර තෙවන අදියර ක්‍රියාත්මක වීම භාණ්ඩාගාර බැඳුම්කර කල්පිරීමට ඇති කාලය වසර 5 හෝ ඊට අඩු කල්පිරීම් සඳහා පමණක් සීමා කරන ලදී. |